**කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව**

**නීති පීඨය**

**නීතිවේදී උපාධි පරීක්ෂණය, පළමු වසර - 2022**

# ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය

(පැ තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව: **06**

ප්‍රශ්න **<u>තුනකට (03)</u>** පමණක් පිළිතුරු සපයන්න.

(නොපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කෙරේ)

---

**1.** **'රෝම-ලන්දේසි නීතිය, ශ්‍රී ලංකාවේ පොදු නීතිය බවට වන හිමිකම් පෑම කාලයෙහි පරීක්ෂනයට මුහුණ දී ඇත. කෙසේ වෙතත්, මුල් කාලයේ බ්‍රිතාන්‍ය උසාවි රෝම- ලන්දේසි නීතියට සීමාකාරී සහ අනුකම්පා විරහිත ප්‍රවේශයක් අනුගමනය කිරීමත් සමඟ ගමන දුෂ්කරව තිබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එක් අතකින්, නූතනයේ රෝම-ලන්දේසි නීතියේ අදාළත්වයේ ප්‍රමාණය තීරණය කිරීමටත්, අනෙක් අතට, රෝම-ලන්දේසි නීතියෙන් උසාවි බැහැර වන අවස්ථාවන් තීරණය කිරීමටත් උසාවිය පරීක්ෂණ කිහිපයක් සම්මත කර ඇත.'**

අභාවිතය පිළිබඳ සිද්ධාන්තයේ (The doctrine of desuetude) ~~මූලධර්මයේ~~ අධිකරණමය භාවිතය සහ 'නොබිඳුණු සහ ප්‍රකාශිත තීරණ මාලාවේ' ප්‍රවේශය සහ රෝම-ලන්දේසි නීතියේ නූතන භාවිතය සඳහා එහි ඇති ඇඟවුම්වලට අදාළව ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න. අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා අධිකරණ තීරණ අධිකාරීන් ඇසුරින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

(ලකුණු 100)

**2.** (අ) සහ (ආ) යන ප්‍රශ්න **<u>දෙකටම</u>** පිළිතුරු සපයන්න.

**(අ)** " උඩරට නීතිය තවදුරටත් දේශභූමික නීතියක් නොවේ."

ඔබ එකඟ වන්නෙහිද? නීතිමය අධිකාරීන් ආශ්‍රයෙන්, ඉහත උපුටා ගැනීම වෙත විශේෂ අවධානය යොමු කරමින් කෙටි සටහනක් ලියන්න.

**P.T.O**

**(ආ)** නිහාරා, සුනිල් සමඟ වලංගු විවාහයකට එළඹුණාය. ඇයගේ විවාහය උඩරට නීතිය යටතේ නිසි පරිදි ලියාපදිංචි කළ අතර, එය දීග විවාහයක් ලෙස සැලකුනි. කෙසේ වෙතත්, ඇයගේ විවාහයෙන් දින කිහිපයකට පසු, දැඩි ලෙස රෝගාතුරුව සිටි තම පියාට උපකාර කිරීම සඳහා නිහාරා, සුනිල් සමඟ නැවත සිය පියාගේ නිවසට පැමිණි අතර, ඇය කිසි දිනක සුනිල්ගේ නිවසට නැවත නොපැමිණියාය. නිහාරාගේ පියාගේ මරණයෙන් පසු, නිහාරා කියා සිටින්නේ ඇය තම පියාගේ නිවසට පැමිණි දින සිට ඇගේ විවාහය බින්න විවාහයක් බවට පරිවර්තනය වූ බැවින්, තම පියාගේ දේපළ පිළිබඳ අයිතිය ඇය සතුව පවතින බවයි.

නිහාරාට උපදෙස් දෙන්න.

අදාළ නීති අධිකාරීන් මගින් ~~නිහාරාට උපදෙස් දෙන්න.~~ ඔබගේ පිළිතුර සනාථ කරන්න.

^

**(ලකුණු 50x2 =100)**

**3.** "ඉංග්‍රීසි නීතිය බ්‍රිතාන්‍ය යටත් විජිතවලට ව්‍යාප්ත කිරීම සම්බන්ධයෙන් අනුගමනය කරන ලද සාමාන්‍ය පිළිවෙත වූයේ එංගලන්තයේ නිශ්චිත දිනයක ක්‍රියාත්මක වන නීතිය සම්මත කිරීමයි. සමහර අවස්ථාවලදී, විවිධ චාරිත්‍රානුකූල නීතිවල සීමිත යෙදීම්වලට යටත්ව මෙය සිදු කරන ලදී."

*-Kenneth Roberts Wray, Commonwealth and Colonial Law (1966), pp. 529-557*

ඉහත ප්‍රකාශය ශ්‍රී ලංකාවේ සන්දර්භයට අදාළ යැයි ඔබ සිතන්නෙහිද? ශ්‍රී ලංකාව තුළ ඉංග්‍රීසි නීතිය ස්ථාපිත කිරීම සඳහා බ්‍රිතාන්‍ය පාලකයන් අනුගමනය කළ පිළිවෙත් සහ ක්‍රියා පටිපාටි විස්තර කරන්න. අදාළ නීති අධිකාරීන් ඇසුරින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

**(ලකුණු 100)**

**4.** සුදාකර් 1995 වසරේ නුවරඑළියේ සිට යාපනයේ හින්දු විද්‍යාලයේ විදුහල්පතිවරයා ලෙස මාරු කර යවා ඇත. ඔහුගේ ස්ථාන මාරුවෙන් වසර පහකට පසු ඔහු යාපනයේ ස්ථිරව පදිංචි වූ අතර ඔහුගේ පුත් බාලචන්ද්‍රන් යාපනයේ කරෙයිනගර්හි උපත ලැබීය. සුදාකර්ගේ දෙමාපියන් මුලින් ඉන්දියාවේ තමිල්නාඩුවේ සිට යාපනයට සංක්‍රමණය වූ අතර, පසුව නුවරඑළියේ ව්‍යාපාරයක් පවත්වාගෙන ගියහ. සුදාකර් 1960 දී නුවරඑළියේ උපත ලැබුවේ ඔහුගේ දෙමව්පියන් ඔවුන්ගේ ව්‍යාපාරික කටයුතු සඳහා එහි රැඳී සිටින කාලය තුළය. බාලචන්ද්‍රන් යාපනයේ අධ්‍යාපනය ලබමින් හැදී වැඩුණු අතර කොළඹ විශ්වවිද්‍යාලයෙන් කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා ඇත. ඔහු විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබන කාලය තුළ බාලචන්ද්‍රන්ගේ පහසුව සඳහා වැල්ලවත්ත ප්‍රදේශයේ ඔහුගේ දෙමාපියන් මිලදී ගෙන ඔහුට තෑගී කළ මහල් නිවසක නැවතී සිටියේය. ඔහු දෙහිවල ප්‍රදේශයේ සිංහල තරුණියක් වූ සුනිලා සමඟ සම්බන්ධයක් පටන් ගත්තේය. ඔහු සුනිලා සමඟ විවාහ වීමට බලාපොරොත්තු වන අතර, ඇය හින්දු ආගම වැළඳ ගැනීමට එකඟ වේ. බාලචන්ද්‍රන්ට සුනිලා සමඟ යාපනයේ කරෙයිනගර්හි ඔහුගේ ස්ථිර පදිංචිය ඇති කිරීමට අවශ්‍ය වන අතර, වැල්ලවත්තේ පිහිටි මහල් නිවාසය විකිණීමට අදහස් කරයි. බාලචන්ද්‍රන් සහ සුනිලා තමන්

තේසවලමේ නීතිය යටතේ පාලනය වන්නේද යන්න පිළිබඳව ඔබේ උපදෙස් පතයි. පහත කරුණු සම්බන්ධයෙන් බාලචන්ද්‍රන් සහ සුනිලාට උපදෙස් දෙන්න.

**(අ)** ඔවුන්ගේ විවාහය සහ අනුප්‍රාප්තිය සඳහා පුද්ගලික නීතිය ලෙස තේසවලමේ නීතිය යෙදිය හැකිද නැද්ද යන්න.

**(ලකුණු 60)**

**(ආ)** වැල්ලවත්ත මහල් නිවස සඳහා අදාළ නීතිය කුමක්ද?

**(ලකුණු 40)**

අදාළ ව්‍යවස්ථාපිත විධිවිධාන සහ නඩු නීති මගින් ඔබේ පිළිතුරට සහය දැක්විය යුතුය.

5. **<u>සියළුම</u>** ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

පහත නීතිමය ගැටළු සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති අදාළ අධිකරණය/විනිශ්චය සභාව (tribunal) සොයා ගන්න. ඔබේ පිළිතුරට අදාළ ව්‍යවස්ථාපිත නීතිය මගින් සහාය දැක්විය යුතුය.

(i) සේවක සංවිධානය විසින් මෑතකදී සංවිධානය කරන ලද වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයට සහභාගී වීමට ඉඩ නොදීම සම්බන්ධයෙන් රාජ්‍ය සංවිධානයක් වන තම සේවායෝජකයාට එරෙහිව නඩුවක් පැවරීමට හෙන්රි අපේක්ෂා කරයි.

(ii) තම අපනයන ව්‍යාපාරය සඳහා භාවිතා කරන වෙළඳ ලකුණ, එම කර්මාන්තයේම වෙනත් ව්‍යාපාරයක් විසින් භාවිතා කරන බව Zoya සොයා ගන්නා අතර, ඇයගේ බුද්ධිමය දේපළ අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමට එරෙහිව අධිකරණයේ නඩුවක් පැවරීමට ඇය බලාපොරොත්තු වේ.

(iii) ගීතා තම සැමියා වන සුනිල්ට එරෙහිව දික්කසාද නඩුවක් ගොනු කර තම දරුවන් දෙදෙනාගේ භාරකාරත්වය සහ නඩත්තුව යන දෙකම අපේක්ෂා කරයි.

(iv) Zigma Pvt Ltd යනු පුද්ගලික අපනයන සමාගමකි. මෑතකදී එම සමාගම කිසිදු හේතුවක් නොදක්වා එහි සේවකයින් 20 දෙනෙකුගේ සේවය අවසන් කළේය. රැකියාවෙන් ඉවත් කළ සේවකයෝ සමාගමේ ක්‍රියාව අභියෝගයට ලක් කිරීමට අපේක්ෂා කරති.

(v) සමන් නොසැලකිලිමත් ලෙස රිය පැදවීම හේතුවෙන් ලීලාගේ මෝටර් රථයට සිදු වූ අලාභය සඳහා සහනයක් ඉල්ලා සිටීමට ඔහුට එරෙහිව නඩුවක් පැවරීමට ලීලා බලාපොරොත්තු වේ.

**(ලකුණු 20x5=100)**

**6. (අ) සහ (ආ)** යන ප්‍රශ්න **<u>දෙකටම</u>** පිළිතුරු සපයන්න.

**(අ)** රෝමානු කතෝලිකයන් වන ටෝනි (Tony) සහ පෙපර් (Pepper), ක්‍රිස්තියානි චාරිත්‍ර අනුව විවාහ විය. ඔවුන්ගේ විවාහය ලියාපදිංචි කර ඇත්තේ ශ්‍රී ලංකාවේ විවාහය පිළිබඳ සාමාන්‍ය නීතියට අනුවය. විවාහ වී වැඩි කල්

නොගොස් මෙම යුවළ ආර්ථික දුෂ්කරතාවලට මුහුණ දුන් අතර නිතර නිතර රණ්ඩු දබර ඇති කර ගත්හ. ටෝනිට දික්කසාද වීමට අවශ්‍ය වුවද, එය ඇගේ ආගමික විශ්වාසයන්ට පටහැනි බැවින් පෙපර් එය ප්‍රතික්ෂේප කළාය. වසර කිහිපයකට පසු ටෝනිට ෆස්නා (Fazna) මුනගැසී ඔවුහු ආදරයෙන් බැඳුණහ. ටෝනිගේ තත්ත්වය සහ ඔහුගේ විවාහය සම්බන්ධයෙන් ඇති ගැටලු ගැන ෆස්නා අනුකම්පා කළාය. පසුව ටෝනි ඉස්ලාම් ආගමට හැරුණු අතර ඔහුගේ පළමු විවාහය විසුරුවා හැරීමකින් තොරොව ෆස්නා සමඟ දෙවන විවාහයක් කර ගත්තේය. පෙපර් ටෝනිට විරුද්ධව පොලිසියට පැමිණිල්ලක් කළාය. ටෝනි කියා සිටින්නේ ඔහුගේ දෙවන විවාහය මුස්ලිම් පුද්ගලික නීතිය යටතේ නීත්‍යානුකූල බවයි. ටෝනිට උපදෙස් දෙන්න. අදාළ අධිකරණ තීරණ අධිකාරීන් සහ ව්‍යවස්ථාපිත ප්‍රතිඥාන ඇසුරින් ඔබේ පිළිතුර සනාථ කරන්න.

**(ආ)** අබ්දුල්ලා සහ සාරා 2014 දී විවාහ වූ අතර ඔවුන්ට සේයින් (Zain) නම් පුතෙක් සිටියේය. වැඩි කල් යන්නට මත්තෙන්, අබ්දුල්ලා සහ සාරා ඔවුන්ගේ ආගමික විශ්වාසයන් හා පිළිවෙත්වලට අනුකූලව හමීඩ්ව දරුකමට ගත්තේය. පෙර සබඳතාවයකින් සාරා ගේ දරුවා වූ මුතාලිබ්ද අබ්දුල්ලා පිළිගෙන සැළකුවේ ඔහුගේම පුතා ලෙශසය. අබ්දුල්ලා සහ සාරා තම දරුවන්ට එක හා සමානව ආදරය දක්වා සැලකූ අතර, ඔවුන්ට ඔවුන්ගේ දේපළවල සමාන කොටස් හිමි කර දීමට අවශ්‍ය විය. අවාසනාවකට අබ්දුල්ලා අන්තිම කැමති පත්‍රයක් නොතබා හදිසියේ මිය ගියේය.

මුස්ලිම් නීතිය යටතේ අන්තිම කැමති පත්‍රයක් නොමැතිව උරුමය ලැබීම සම්බන්ධයෙන් සේයින්, හමීඩ් සහ මුතාලිබ්ගේ අයිතිවාසිකම් ගැන සාකච්ඡා කරන්න. අදාළ නඩු තීන්දු නීති සහ ව්‍යවස්ථාපිත ප්‍රතිප්‍රදාන සමඟ ඔබේ පිළිතුර සනාථ කරන්න.

************************